සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව

ගණිතය - 4 ශ්‍රේණිය / තෙවන වාරය - ජූලි මාසය - 3 වන සතිය

සැකසුම - රත්නපුර අධ්‍යාපන කලාපය / කේ.වි. අසංක දේශප්‍රිය අබේරත්න.

## ඒකකය 25 - සංඛ්‍යා 3

දුවේ පුතේ අද අපට තියෙන්නේ සංඛ්‍යා පාඩම. අපි මුලින්ම පහතින් දක්වා ඇති ක්‍රියාකාරකම සිදු කරමු කෝ....

ක්‍රියාකාරකම 1.

- 0 සිට 9 දක්වා සංඛ්‍යාපත් සකස් කර ගන්න.සංඛ්‍යාපත් අනෙක් පැත්ත හරවා තබා ගන්න.
- එම සංඛ්‍යාපත් අතුරින් තමන්ට සිතෙන සංඛ්‍යාපත් 4 ගෙන ඉලක්කම් 4 සංඛ්‍යා 10 ක් ගොඩ නගන්න.
- එම සංඛ්‍යා නාමය ශබ්ද නගා කියවන්න . ඒවායේ සංඛ්‍යා නාමය ලියන්න.

ක්‍රියාකාරකම 2

- පහත දැක්වෙන ආකාරයේ සංඛ්‍යා පෙතක් ඇඳ ගන්න.

| | | | |
|---|---|---|---|
| 9000 | 900 | 90 | 9 |
| 8000 | 800 | 80 | 8 |
| 7000 | 700 | 70 | 7 |
| 6000 | 600 | 60 | 6 |
| 5000 | 500 | 50 | 5 |
| 4000 | 400 | 40 | 4 |
| 3000 | 300 | 30 | 3 |
| 2000 | 200 | 20 | 2 |
| 1000 | 100 | 10 | 1 |

- දාදු කැටයක් හා මදටිය ඇට 4ක් ගන්න.
- දාදු කැටය වරක් උඩ දමන්න.ලැබෙන ඉලක්කමේ අගය බලන්න .දැන් මදටිය ඇටයක් ගෙන සංඛ්‍යා පෙතේ දහසස්ථානයේ එම අගයට අදාල සංඛ්‍යාව මතින් මදටිය ඇටය තබන්න.( දැදු කරටයේ 5 ලැබුණා නම් සංඛ්‍යා පෙතේ 5000 මත මදටිය ඇටය තබන්න)
- දෙවන වරටත් දාදු කැට උඩ දමන්න. ලැබෙන අගයට සමානව සංඛ්‍යා පෙතේ සියයස්ථානයේ සංඛ්‍යාව මත මදටිය ඇටය තබන්න.
- මේ ආකාරය තුන්වන වර හා සිව්වන වරටද සිදු කර දහයස්ථානය හා සියස්ථානය මත මදටිය ඇට තබන්න.
- දැන් ලැබෙන ඉලක්කම් 4 සංඛ්‍යාව පහත වගුවේ ලියා ගන්න. නැවත සංඛ්‍යාවක් ගොඩ නගා ඒ ඇසුරින් පහත වගුව පුරවන්න.

2. පහත දැක්වෙන වගුව අභ්‍යාස පොතක පිටපත් කර ගන්න . සංඛ්‍යාපත් ඇසුරින් ඉලක්කම් 4 සංඛ්‍යා දෙක බැගින් ගොඩ නගන්න. ඒ අනුව වගුව පුරවන්න. ( මෙම ක්‍රියාකාරකම වාර කිහිපයක් සිදු කරන්න.)

| ඔබ ගොඩ නගන ලද සංඛ්‍යා අතුරින් | | විශාල සංඛ්‍යාව | කුඩා සංඛ්‍යාව |
|---|---|---|---|
| පළමුව ගොඩ නැගූ සංඛ්‍යාව | දෙවනුව ගොඩ නැගූ සංඛ්‍යාව | | |
| | | | |
| | | | |

3.පහත දැක්වෙන සංඛ්‍යා කුඩාම සංඛ්‍යාවේ සිට විශාලම සංඛ්‍යාවටත් විශාල සංඛ්‍යාවේ සිට කුඩාම සංඛ්‍යාවටත් පටිපාටිගත කරන්න.

| | | |
|---|---|---|
| ★. 4683 , 6384 , 3250 | ★. 3256 , 3288 , 3280 | ★. 1859, 1950 , 1725 |
| ★. 2832 , 5421 , 4528 | ★. 9863 , 9576 , 9250 | ★. 9089 , 5083 , 7082 |
| ★. 2640 , 2373 , 2760 | ★. 4325 . 6578 , 5638 | ★. 3820 , 3850 , 3860 |